මුද්දර මෙහි අලවා ප්‍රධාන ණයකරු විසින් අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

# ඇප බැඳුම්කරය

සියලු දෙනා විසින් දැන ගැනීම පිණිසයි.

..........................................................................................................................................

පදිංචි, ශික්ෂණලාභියෙකු වශයෙන් ............................................ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ තුන් අවුරුදු පූර්ව ජාතික සේවා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා ...................................................... ..................................................(පාඨමාලාවේ නම) ...................................(මාධ්‍යය) පාඨමාලාව හදාරන .......................................................................................................................

ණයකරු වශයෙන් ද .........................................................................................................

පදිංචි............................................................................................................................... සහ

............................................................................................................................................

පදිංචි ....................................................................................................................................

යන අපි ඇපකරුවන් වශයෙන් ද (මෙහි මින් මතු අප සැවොම ඇතැම් විට, සාමූහික වශයෙන් බන්ධනදායින් යනුවෙන් හඳුන්වනු ලැබෙත්) මෙහි "අ" යයි ලකුණු කර ඇති ලේඛනයේ අනු පිළිවෙලින් අපේ වත්කම් හා බැරකම් පිලිබඳ සත්‍ය වූත්, නිවැරදි වූත් ප්‍රකාශයක් අමුණා ඇති අතර, එකී වත්කම් මෙම බැඳුම්කරය බලපවත්නා තාක් කල් තත්කාලීනව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධ්‍යාපන ලේකම් ධූරය දරන්නාහුගේ ලිඛිත අනුමැතිය නොමැතිව විකිණීම, උකස් තැබීම, අන්සතු කිරීම හෝ වෙනයම් අයුරකින් බැහැරදීම හෝ නොකරන හැටියට පොරොන්දු වෙමින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ඉල්ලා සිටි විට, ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් ......................................................................................................... (රු.......................................) ...................................................... දී හෝ කොළඹ දී ගෙවීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අප සැවොම එක්ව හා වෙන් වෙන් වශයෙන් ද, මෙයින් ස්ථිරව බැඳී සිටින අතර, එකී මුදල නිසි පරිදි සහ සත්‍ය ලෙස ගෙවන බවට එකී බන්ධනදායින් වන අප සියළු දෙනාම එක්ව හා වෙන් වෙන්ව බැඳෙන අතරම පිළිවෙලින් අප හා අප එක් එක් කෙනාගේ උරුමක්කාර, පොල්මඃකාර, අද්මිනිස්ත්‍රාසිකාරයන් ද සාමූහිකව සහ වෙන් වෙන් වශයෙන් තරයේ බැඳ තබමු.

තවද, පූර්වොක්ත ඇපකරුවන් වන ..........................................................................................

සහ ......................................................................................... යන අප දෙදෙනා මෙම ඇප බැඳුම්කරය අත්සන් කරන්නේ " Beneficium Ordinis division is et excussionis " හෙවත් පිළිවෙලින් අයකර ගැනීමේ හා බෙදා ගෙවීමේ වාසියත් එහි බලයත්, අර්ථයත් එම වාසිය අත්හැර දැමීමේ විපාකත් අපගේ නීතිඥවරයා වන ......................................................................... ............................................................. විසින් අප එක් එකිනෙකාට තේරුම් කර දෙන ලදින්, අපට එහි යථාර්ථය සම්පූර්ණයෙන් වැටහී ඇති බව මෙයින් පිළිවෙලින් ප්‍රකාශ කරමින් ඇපකරුවන්ට නීතියෙන් හිමි වෙනත් සියලු ඵල ප්‍රයෝජන, වරප්‍රසාද හා ව්‍යතිරේකයනුත් අත් හරිමින්,

වර්ෂ දෙදහස් ...................... ක් වූ ..................................................... මස ...................... දින වන මෙදින ..................................................................... දී අත්සන් තබන ලදී.

එකී ........................................................................................ විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් ක්‍රියාකරන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමඟ ඇතුළත් වන්නට යෙදුන වර්ෂ දෙදහස් ........................................ ක් වූ ........................................... මස ............................. දින දරණ ගිවිසුම අනුව එකී ..................................................................... එකී ගිවිසුමේ නියම කර ඇති පරිදි වර්ෂ තුනක (03) කාලයක් තුළ ශික්ෂණලාභීන් සඳහා වන පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීමටත් එම හැදෑරීම් සතුටුදායක ලෙස අවසන් කිරීමෙන් පසු, එකී ගිවිසුමේ සඳහන් නියමයන් හා කොන්දේසි අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සේවය කිරීමටත් ගිවිස ගෙන ඇති හෙයින් ද,

එසේම එකී, ........................................................................................................ එකී ගිවිසුමේ සඳහන් කොන්දේසි, නියමයන් හා වගන්ති විධි වූ පරිදි හා අවංකවත් ඉටු කරන බවට හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට එහි සඳහන් පරිදි සේවය කරන බවට, රුපියල් ...................................... (රු. .....................................) මුදලක් සඳහා වූ ඇප බැඳුම්කරයකට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලද ඇපකරුවන් දෙදෙනෙකු ද ඇතිව ඇතුළත් විය යුතුව ඇති බව එකී ගිවිසුමේ සඳහන් කොට එසේ කරන බවට එකී ................................................................................ එකඟව ඇති හෙයින් ද,

එසේ ම ............................................................................................................................ සහ ............................................................................................................................. යන අප දෙදෙනා එකී ගිවිසුම කියවා බලා, එහි අඩංගු කොන්දේසි හා නියමයන් .......................................... ....................................................... විසින් ඉටු කරන බවට ඇප වී මෙයට, ඇපකරුවන් වීමට එකඟ වී ඇති හෙයින් ද,

මේ ලිඛිත බැඳුකරයේ වග හැටි නම් :-

ඉදින් එකී ................................................................................................. ඉහත කී පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව මනා ලෙස අනලස්ව හා විශ්වාසවන්ත ලෙස හදාරන්නට යෙදී නියමිත කාලය තුළ දී එය සතුටුදායක ලෙස සම්පූර්ණ කර එය අවසන් වූවායින් පසුව අවුරුදු ......................................................... ට නොඅඩු කාලයක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සේවය කළහොත් ගිවිසුමේ අඩංගු වන වෙනත් හා සියළුම නියමයන් හා කොන්දේසි අවංකව හා විධිමත්ව ඉටු කළහොත් මිස එකී .............................. ............................................................. විසින් එකී ගිවිසුමේ අඩංගු වන නියමයන් හා කොන්දේසි කඩකරනු ලැබුවහොත් එසේ කිරීම නිසා ශික්ෂණලාභියා විසින් අත්සන් කරන ලද ගිවිසුම ප්‍රකාරව ගෙවිය යුතු අදාළ මුදල එකී ..................................................................... හෝ .......................................................... හෝ ............................................................... යන අප විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවනු ලැබුවහොත් මෙම බැඳුම්කරය අවලංගුව

බල රහිත වන බව හා එකී කොන්දේසි ඒ ආකාරයෙන් ඉටු නොවූවහොත් මෙම බැඳුම්කරය සම්පූර්ණ බල සහිතව ද, වලංගුව ද, ක්‍රියාත්මකව ද පවත්නා බවය.

මීට සාක්‍ෂ්‍ය වශයෙන් පාර්ශ්වකරුවන් වන අප විසින් මෙහි පහත දැක්වෙන ස්ථාන හා දිනවලදී මේ ගිවිසුමට අත්සන් තබන ලදී.

පූර්වෝක්ත (ශික්ෂණලාභියා වන) ..................................................................................................
විසින් වර්ෂ දෙදහස් ............................... ක් වූ ........................................ මස ...........................
දින ...................................................... දී පහත දැක්වෙන සාක්ෂ්‍යකරුවන් ඉදිරියේ අත්සන් කරන ලදී.

.................................................................

ශික්ෂණලාභියාගේ අත්සන

සාක්‍ෂ්‍යකරුවන්ගේ නම් :-

i. ................................................................................

ii. ................................................................................

පූර්වෝක්ත (බන්ධනදායීන් වන) ......................................................................................................
සහ ....................................................................................................... වර්ෂ දෙදහස්
................................ ක් වූ ...................................... මස ...................................... දින
......................................................................................... දී පහත දැක්වෙන සාක්ෂකරුවන් ඉදිරියේ දී අත්සන් කරන ලදී.

බන්ධනදායින්ගේ නම් :-

i. ...............................................................................

ii. ................................................................................

සාක්‍ෂ්‍යකරුවන්ගේ නම් :-

i. ................................................................................

ii. ................................................................................

ඉහත නම් සඳහන් ඇපකරුවන් මෙහි දැක්වෙන ඇපකරයට අත්සන් තැබීමට ප්‍රථම, කොටස් වශයෙන් සහ අනු පිළිවෙලින් අය කර ගැනීමේ වරප්‍රසාදය යන පාඨයන් හි / පාඨයේ (Beneficium Ordinis division is et excussionis) අර්ථය ද එම වාසිය අතහැර දැමීමේ විපාක මා විසින් ඔවුන්ට විධි වූ පරිදි පහදා දුන් බව මෙයින් සහතික කරමි.

.................................................................

ඇපකරුගේ නීතිඥ තැන                                        නිල මුද්‍රාව :-

# ගිවිසුම

එක් පාර්ශ්වයකට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙහිලා කටයුතු කරන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් **කේ.එම්.ජී.එස්.නාලක කලුවැව** (පද සම්බන්ධය අනුව අවකාශ වන හෝ ඇතුළත් වන තැන්හි මෙම පාර්ශ්වය මෙහි මින්මතු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් හඳුන්වනු ලබන **කේ.එම්.ජී.එස්.නාලක කලුවැව** හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයා හෝ අදාළ වන ඒ ඒ කාලසීමාවල අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ලෙස කටයුතු කරන අනුප්‍රාප්තිකයා හෝ එකී ධූරයේ කටයුතු කරන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉටු කරනු ලබන කාර්යයන් ඉටු කරන නිලධාරියා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් යථා පරිදි පත් කරනු ලැබූ යම් නිලධාරියෙකු ද මෙම පාඨය හෝ වැකිය තුළට ඇතුළත් වන්නේ ය.) හා අනෙක් පාර්ශ්වයට,

.......................................................................................................................... පදිංචි .......................................................................................................................... ද (මෙම පාර්ශ්වය මෙහි මින්මතු "ශික්ෂණලාභියා" වශයෙන් හඳුන්වනු ලබන අතර, පද සම්බන්ධය අනුව අවකාශ වන හෝ ඇතුළත් වන තැන්හි ඉහත සඳහන් අයුරින් එකී ............................................ ................................................... හා ඔහුගේ උරුමක්කාර, පොල්මඃකාර සහ අද්මිනිස්ත්‍රාසිකාරයින් ද එකී පාඨයෙන් හෝ වැකියෙන් අදහස් වන්නාක් මෙන් ම එම පාඨය හෝ වැකිය තුළට ඇතුළත් වන්නේ ය.) අතරේ ඇති කර ගනු ලබන ගිවිසුම වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියකු වන ශික්ෂණලාභියා ............................................................... පිහිටි ...................................................... ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ........................................................................... (පාඨමාලාවේ නම) ............................................. (මාධ්‍යය) තුන් අවුරුදු පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම පිණිස දෙදහස් ........................................... ක් වූ .................................. මස .................................. දින සිට වර්ෂ තුනක (03) කාලයක් .................................................. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඇතුළත් වීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට හැකි වන පරිදි මෙහි පහත දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට එකී ශික්ෂණලාභියා එකඟ වී ඇති හෙයින් ද පහත සඳහන් පරිදි ගිවිස ගනු ලැබේ.

1. ....................................................... පිහිටි ......................................... ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට බැඳී තමන් සඳහා පිළියෙල කර ඇත්තා වූ ද නියම කෙරෙන්නා වූ ද පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව එම ආයතනයට ඇතුළත් වූ දින සිට වර්ෂ තුනක (03) කාලයක් තුළ අනලස්ව හා කාර්යක්ෂමව හදාරා සාර්ථකව සම්පූර්ණ කිරීමට ශික්ෂණලාභියා එකඟ වෙයි.

2. පාඨමාලාව හදාරනු ලබන කාල සීමාව තුළ තමන් විසින් ඉටුකළ යුතු කාර්යයන් හා වෙනත් කරුණු පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතින් ලැබෙන කවර අන්දමේ හෝ උපදෙසක් වුව ද පිළිපැදීමට ශික්ෂණලාභියා එකඟ වෙයි.

3. පහත සඳහන් කරුණු හේතු කොට ගෙන මෙම ශික්ෂණලාභියාගේ ශිෂ්‍යභාවය කවර අවස්ථාවක වුව ද අවලංගු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

(අ) පාඨමාලා කාලය තුළ තමාගෙන් අපේක්ෂිත හැසිරීම, උද්‍යෝගය හා අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය නොපෙන්වන (විෂය සමගාමී කටයුතු ද ඇතුළුව) හෝ ආයතනික පුහුණුවේ ප්‍රථම වර්ෂය තුළ දී කරනු ලබන ඇගයීමේ දී සතුටුදායක මට්ටමකට එළඹීමට අපොහොසත් වීම.

(ආ) පාඨමාලා කාල සීමාව තුළ දී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය මඟින් හඳුන්වා දී ඇති, පිළිපැදීමට නියමිත විනය නීති-රීති මාලාව තනිව හෝ සාමූහිකව චේතනාන්විතව හා දැඩිව උල්ලංඝනය කිරීම හෝ විෂමාචාරය.

(ඇ) අනෙකුත් ශික්ෂණලාභීන්ට කායිකව, මානසිකව හිංසා පීඩා පැමිණවීම හෝ චේතනාන්විතව රජයේ දේපළවලට හානි පැමිණ වීම.

(ඈ) අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධරීන්ගෙන් සමන්විත කමිටුවක හා රජයේ රෝහලක වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ අනුව, අදාළ පාඨමාලාව සාර්ථකව හැදෑරීමට යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් නොමැති බවට තහවුරු වීම.

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා තිබිය යුතු යෝග්‍යතාව, මූලික අධ්‍යාපන සුදුසුකම්, අනෙකුත් අධ්‍යාපන හා විශේෂ සුදුසුකම් පිළිබඳව වැරදි හා සාවද්‍ය තොරතුරු ඉල්ලුම්පතෙහි සඳහන් කිරීම හා ඒවා සනාථ කිරීම වස් කූඨ හා වංචනික සහතික ඉදිරිපත් කර තිබීම.

(ඊ) පාඨමාලා කාලසීමාව තුළ දී ශික්ෂණලාභියා විවාහය ලියාපදිංචි කිරීම හෝ අයදුම්කරන විට / විද්‍යාපීඨ ලියාපදිංචියට පෙර විවාහය ලියාපදිංචි කර ඇති බව / දීක්කසාද වී ඇති බව යන කවර කරුණක් පිළිබඳව හෝ තොරතුරු සනාථ විම.

(උ) පූජ්‍ය / පූජක පක්ෂය පාඨමාලාවට ලියාපදිංචි වීමෙන් අනතුරු ව පාඨමාලා කාලය තුළ උපැවිදි වීම.

(ඌ) රජයේ විශ්වවිද්‍යාලයක / රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස.(උසස් පෙළ) සුදුසුකම් වලින් බඳවා ගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද" යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වී සිටීම / හදාරමින් සිටීම / උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කර තිබීම හෝ ඉහත ආයතනයක මෙහි සඳහන් ආකාරයේ පාඨමාලාවක ලියාපදිංචි වී ගැසට් නිවේදනය පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කර ගෙන තිබීම හෝ ගැසට් නිවේදනය පළවීමෙන් පසුව / සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ඉහත කී ආයතනයක අදාළ පාඨමාලාවකට ලියාපදිංචි වී එය අවලංගු කර ගෙන තිබීම යන කවර කරුණක් / කරුණු සනාථ වීම.

(එ) පාඨමාලාවට අයදුම්කරන අවස්ථාව වන විට රජයේ හෝ රජයේ ආධාර ලබන උපකෘත පාසල්වල, රජයේ ලියාපදිංචි පිරිවෙන්වල හෝ අනුමත වෙනත් විද්‍යායතනවල ගුරු පත්වීමක් ලබා තිබීම හෝ රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරා ගනු ලැබ තිබීම පිළිබඳ තොරතුරු සනාථ වීම.

(ඒ) පාඨමාලාවට අයදුම් කරන අවස්ථාව වන විට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරමින් සිට හැර ගොස් තිබීම, හදාරමින් සිටීම, හදාරා අවසන් කර තිබීම හෝ විනයානුකූල හේතූන් මත හෝ වෙනත් හේතූන් මත හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ශිෂ්‍යභාවය අවලංගු කර තිබීම පිළිබඳ තොරතුරු සනාථ වීම.

(ඔ) අර්ධ කාලීනව හෝ වෙනත් රැකියාවක නිරත වන බවට කරුණු සනාථ වීම.

ඉහත කරුණු මත යම් ශික්ෂණලාභියකුගේ ශිෂ්‍යභාවය අවලංගු කරනු ලැබූ විට, මෙම ගිවිසුම යටතේ දෙනු ලබන කිසිම එල ප්‍රයෝජනයක් හෝ වරප්‍රසාදයක් හෝ එසේත් නැත්නම් වෙන යම් වන්දියක් හෝ ශික්ෂණලාභියාට හිමි නොවන අතර ගිවිසුම කඩකිරීම මත රුපියල් ලක්ෂ අටක (රු.800,000.00) මුදලක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවීමට ශික්ෂණලාභියා එකඟ වෙයි.

තවද, ඉහත 3 වගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් පරිදි පාඨමාලාව හැදෑරීම සඳහා යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් නොමැති බව සනාථ වූ අවස්ථාවක දී හැර ඉහත 3 වගන්තියේ සඳහන් අන් කවර හේතුවක් මත ශිෂ්‍යභාවය අවලංගු කළ ද ගිවිසුමේ හා ඇප බැඳුම්කරයෙහි සඳහන් සම්පූර්ණ මුදල වන රුපියල් ලක්ෂ අටක (රු. 800,000.00) මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවීමට ශික්ෂණලාභියා එකඟ වෙයි.

ඉහත 3 වගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් පරිදි පාඨමාලාව හැදෑරීම සඳහා යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් නොමැති වීම හේතුවෙන් ශිෂ්‍යභාවය අවලංගු කළ විට මුදල් ගෙවීමකින් තොරව පාඨමාලාවෙන් ඉවත් විය හැක.

පාඨමාලාව සඳහා නියමිත වසර තුනක (03) කාල සීමාව සම්පූර්ණ කිරීමට පෙර, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වූ දින සිට, කැලැන්ඩර දින හැටක් (60) ඇතුළත පාඨමාලාවෙන් ඉවත් වන්නේ නම්, ශික්ෂණලාභියා වෙනුවෙන් එතෙක් දරන ලද වියදම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවීමට ශික්ෂණලාභීයා එකඟ වෙයි.

කැලැන්ඩර දින හැටකින් (60) පසුව පාඨමාලාවෙන් ඉවත්වන්නේ නම් ගිවිසුමේ සහ ඇප බැඳුම්කරයෙහි සඳහන් සම්පූර්ණ මුදල වන රුපියල් ලක්ෂ අටක (රු. 800,000.00) මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවීමට ශික්ෂණලාභියා එකඟ වෙයි.

පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, පත්වීම් ලබන අවස්ථාවේ පවත්නා ගුරු පුරප්පාඩු මත, දිවයිනේ ඕනෑම දිස්ත්‍රික්කයක / පළාතක පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු යටතේ වන රජයේ පාසලකට ලබා දෙනු ලබන පත්වීම භාර නොගන්නේ නම් හෝ කිසිසේත්ම සේවය නොකරන්නේ නම් හෝ වෙනත් කවර ආයතනයකට හෝ නිදහස් වන්නේ නම් හෝ ගිවිසුමේ සහ ඇප බැඳුම්කරයෙ හි සඳහන් සම්පූර්ණ මුදල වන රුපියල් ලක්ෂ අටක (රු.800,000.00) මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවීමට ශික්ෂණලාභියා එකඟ වෙයි.

තව ද රෝගාතුර වීම හේතු කොට ගෙන තම පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ කාල පරිච්ඡේදය දීර්ඝ කරන ලෙස ශික්ෂණලාභියා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යම් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් තමා රෝගාතුර වී සිටින බව සනාථ කරනු පිණිස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලද වෛද්‍ය නිලධාරියෙකුගේ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

යථෝක්ත කරුණු නිසා හෝ වෙනත් කරුණක් නිසා හෝ ශික්ෂණලාභියාගේ පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ කාල පරිච්ඡේදය දීර්ඝ කරනු ලැබුවහොත්, එවිට එසේ දීර්ඝ කරනු ලැබූ කාලසීමාවේ දී මෙම ගිවිසුමේ සඳහන් නියමයන්ට අනුව, දිගටම පාඨමාලාව හැදෑරිය යුතු වන අතර, එසේ දීර්ඝ කරනු ලැබූ කාල පරිච්ඡේදය මුලින් වූ පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ කාල පරිච්ඡේදයට ඇතුළත්ව තිබුණාක් මෙන් සලකා මෙම ගිවිසුමේ විධිවිධාන සර්වප්‍රකාරයෙන් ම බල පෑ යුතු වන අතර, මෙහි 5 වන ඡේදයෙහි සඳහන් කාල පරිච්ඡේදයට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරනු ලබන අමතර කාලසීමාව ගතවන තුරු ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සේවය කළ යුතුය.

4. තවද ශික්ෂණලාභියා විසින්:

   (අ) කිසිම වෙනසක් නොකර ස්වකීය පූර්ව සේවා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් සවිස්තර වැඩ ක්‍රමය හා ඇගයීම් ක්‍රමය අනුගමනය කරමින් තමන්ට නියම කර ඇති පරිදි අධ්‍යයන කටයුතු කරගෙන යාමට ද,

(ආ) මෙහි ලා සඳහන් කර ඇති සුදුසුකම් සහ / හෝ පාඨමාලාව හැර වෙනත් සුදුසුකම් සහ / හෝ පුහුණුවක් ලබා ගැනීම සඳහා වෙනත් අධ්‍යයන හෝ අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමක් නොකිරීමට ද,

(ඇ) නීත්‍යානුකූලව පාඨමාලාවෙන් ඉවත්වීමකින් තොරව මිස පාඨමාලාවේ කාලසීමාව තුළ හෝ ස්ථිර ගුරු පත්වීමක් ලබා දීම දක්වා වන කාලය අතරතුර හෝ විදේශ ගත නොවීමට ද,

ශිෂ්‍ය ගනු ලැබේ.

5. එකී පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාසලකට ගුරු පත්වීමක් දුනහොත්, එවකට පවත්නා කොන්දේසිවලට යටත්ව, මුල් පත්වීම් දින සිට අවම වශයෙන් වසර පහක (05) සක්‍රීය කාලයක් තමන් මුල් පත්වීම ලබන ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයේ / ස්ථිර පදිංචි පළාතේ හෝ ජාතික පදනම යටතේ නම් කරනු ලබන දිස්ත්‍රික්කයේ හෝ කවර හෝ දිස්ත්‍රික්කයේ / පළාතේ පාසලක අනලස් ව හා කාර්යක්ෂම ව සේවය කළ යුතුය. එසේ ලබා දෙනු ලබන පත්වීමක් භාර නොගන්නේ නම් ගිවිසුමෙහි සහ ඇප බැඳුම්කරයෙ හි සඳහන් සම්පූර්ණ මුදල වන රුපියල් ලක්ෂ අටක (රු. 800,000.00) මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවිය යුතු වේ. එසේම පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, මුල් පත්වීම් දින සිට වසර පහක් (05) රජයට සේවය නොකරන්නේ නම් හෝ වෙනත් රැකියාවකට යාම සඳහා සේවයෙන් ඉවත් වන්නේ නම් හෝ සේවය කළ යුතු අදාළ වසර පහෙන් (05) ඉතිරිව ඇති කාලයට (මාස වශයෙන් ගණනය කර) ගිවිසුම සහ ඇප බැඳුම්කරයට අනුව අදාළ මුදල,

$$\left(\frac{\text{රු. 800,000.00}}{\text{මාස 60}} \text{ X } \text{සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇති මාස ගණන}\right)$$

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවීමට ද, නැවත ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරියෙකු ලෙස ගුරුවෘත්තියට පිවිසීමට අවස්ථාවක් නොලැබෙන බවට වන කොන්දේසිය පිළිපැදීමට ද ශික්ෂණලාභියා එකඟ වෙයි.

තවද, ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාවක් සහිත ව ගුරු වෘත්තියේ යෙදී සිටිය දී මුල් වර්ෂ පහ (05) තුළ සේවයෙන් ඉවත් ව විදේශ ගත වන්නේ නම්, ගිවිසුම සහ ඇප බැඳුම්කරය අනුව මුළු වටිනාකමින් (රු. 800,000.00) අදාළ වසර පහෙන් (05) සේවය කිරීමට ඉතිරිව ඇති කාලය සඳහා (මාස වශයෙන් ගණනය කර) ගෙවිය යුතු මුදල,

$$\left(\frac{\text{රු. 800,000.00}}{\text{මාස 60}} \text{ X } \text{සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇති මාස ගණන}\right)$$

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවීමට ද, ශික්ෂණලාභියා එකඟ වෙයි.

මුල් වර්ෂ පහට (05) ඇතුළත් පරිවාස කාලය තුළ දී නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් නොවී විදේශ ගත වන්නේ නම් ගිවිසුම, ඇප බැඳුම්කරය හා ආයතන සංග්‍රහයේ නීති රීති හා රෙගුලාසි, පවතින චක්‍රලේඛ හා අදාළ කාලසීමාවේ බලපැවැත්වෙන නීති රීති ද අනුව කටයුතු කිරීමට ද, පරිවාස කාලය අවසන් වීමෙන් පසුව වුව ද මුල් වර්ෂ පහ (05) තුළ නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් නොවී විදේශ ගත වන්නේ නම් ගිවිසුම, ඇප බැඳුම්කරය, ආයතන සංග්‍රහයේ අදාළ නීති රීති හා රෙගුලාසි, පවතින චක්‍රලේඛ හා අදාළ කාලසීමාවේ බලපැවැත්වෙන නීති රීති ද ප්‍රකාරව කටයුතු කිරීමට ද ශික්ෂණලාභියා එකඟ වෙයි.

ඉහත කොන්දේසිවලට අමතර ව, විශේෂ ප්‍රතිපාදන යටතේ බඳවා ගන්නා සෑම ආගමකටම අයත් පූජ්‍ය / පූජක පක්ෂය පාඨමාලාව හදාරා අවසන් වීමෙන් පසුව උපැවිදි නොවී අවම වශයෙන් අවුරුදු පහක් (05) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සේවය කිරීමට එකඟ වෙයි. ගුරු සේවයේ මුල් වසර පහ (05) සම්පූර්ණ කිරීමට පෙර උපැවිදි වුවහොත් අදාළ වසර පහෙන් (05) සේවය කිරීමට ඉතිරිව ඇති කාලය සඳහා (මාස වශයෙන් ගණනය කර) අදාළ ගිවිසුම සහ ඇප බැඳුම්කරයට අනුව ගෙවිය යුතු මුදල,

$$\left(\frac{\text{රු. 800,000.00}}{\text{මාස 60}} \times \text{සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇති මාස ගණන}\right)$$

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවීමට ද, පරිවාස කාලයට යටත් ශික්ෂණලාභියෙකු නම්, අදාළ මුදල අය කර ගෙන සේවයෙන් ඉවත් කරනු ලැබීමේ කොන්දේසියට යටත් වීමට ද ශික්ෂණලාභියා එකඟ වෙයි.

ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා බඳවා ගන්නා ශික්ෂණලාභීන් පාඨමාලාව හදාරා අවසන් වීමෙන් පසුව, රජයේ ස්ථිර ගුරු පත්වීම් ලබා වතු අංශයේ පාසල්වල අඛණ්ඩව වසර දහයක් (10) සේවය කිරීමට එකඟ වෙයි.

6. එකී ශික්ෂණලාභියා පාඨමාලාව හදාරා අවසන් කළහොත් හෝ නියමිත කාලයට කලින් ශික්ෂණලාභියාගේ පාඨමාලාව හැදෑරීම නවත්වනු ලැබුව හොත් හෝ ඉහත කී වර්ෂ පහක (05) හෝ මොනයම් කාලයක් තුළ දී හෝ ඔහු සේවයේ නියුක්ත කරවා ගැනීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය බැඳී ඇති බවත් මෙහි සඳහන් කිසිවකින් අදහස් වෙතැයි නොසැලකිය යුතුය.

7. මෙම ගිවිසුම යටතේ ශික්ෂණලාභියාගේ බැඳීම් හා වගකීම් ද එහි සඳහන් නියමයන් කොන්දේසි හා වගන්ති විධි වූ පරිදිත්, අවංකවත් කිරීම හා ඉටු කිරීම සඳහා ඇපයක් වශයෙන් අධ්‍යාපන

අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද ඇපකරුවන් දෙදෙනෙකු ද සමඟ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය නමින් රුපියල් ලක්ෂ අටක (රු. 800,000.00) ඇප බැඳුම්කරයකට ඇතුළත් වීමට ශික්ෂණලාභියා එකඟ වෙයි.

"බැඳුම්කරයේ ඇපකරු වශයෙන් අත්සන් කරනු ලබන තැනැත්තා ගිවිසුමෙ හි නියම කර ඇති උපරිම දණ්ඩන මුදලට සමාන වටිනාකමින් යුත් නිශ්චල දේපළක් හිමි තැනැත්තෙකු හෝ උපරිම දණ්ඩන මුදලින් ¼ ක හෝ ඊට වැඩි ප්‍රමාණයක වාර්ෂික ආදායමක් ලබන කෙනෙකු විය යුතු අතර, ප්‍රධාන ණයකරු වශයෙන් හෝ ඇපකරු වශයෙන් ආණ්ඩුවට ණයගැති වූවකු නොවිය යුතුය."

8. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු වෙනුවෙන් බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරනු ලබන ගිණුම් ප්‍රකාශයන් එහි අඩංගු කරුණු හෝ එහි තබා ඇති අත්සන් හෝ ඔප්පු කිරීමට අතිරේක හෝ වෙනත් සාධක නොමැතිව ඉහත කී 3 සහ 5 යන වගන්ති යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අය විය යුතු වූ මුදල හෝ මුදල් හැටියට බැලූ බැල්මට පිළිගැනෙන සාක්ෂ්‍යයක් වන බවටත් මෙයින් ගිවිස ගනු ලැබේ.

9. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු වෙනුවෙන් නිකුත් කරනු ලබන සහතිකයක් එහි අඩංගු කරුණු හෝ එහි තබා ඇති අත්සන් හෝ ඔප්පු කිරීමට අතිරේක හෝ වෙනත් සාධක නොමැතිව ඉහත කී 3, 4 සහ 5 යන වගන්තිවල සඳහන් කරුණු වලින් ඕනෑම එකක් සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගැනෙන සාක්‍ෂ්‍යයක් බවටත් මෙයින් ගිවිස ගනු ලැබේ.

10. ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා තුන් අවුරුදු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීමෙන් පසු ගිවිසුම හා ඇප බැඳුම්කරයෙහි සඳහන් පරිදි ගුරුවරයෙකු වශයෙන් රජයේ පාසලක වසර පහක (05) සක්‍රීය සේවා කාලය සම්පූර්ණ නොකරන ලද කල්හි අදාළ විස්තරාත්මක ඩිප්ලෝමා සහතිකය ඉල්ලුම් කිරීමට හිමිකම් නොලබන හෙයින් එසේ ඉල්ලුම් නොකිරීමට ශික්ෂණලාභියා ගිවිස ගනු ලැබේ.

11. ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුභවතකු ලෙස රජයේ පාසලක ස්ථිර ගුරුපත්වීමක් ලැබීමෙන් අනතරුව, අදාළ ගුරුභවතාට පූර්ණකාලීන පාඨමාලාවක් හැදෑරීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගත හැක්කේ, අනිවාර්ය සක්‍රීය සේවා කාලය වන වසර පහක් (05) සේවය කිරීමෙන් පසුව බවට වන කොන්දේසියට ශික්ෂණලාභියා එකඟ වෙයි.

12. <u>ශික්ෂණලාභියා පාඨමාලාව සඳහා දිස්ත්‍රික්/පළාත්/ජාතික පදනම යන කුමන පදනමින් බඳවා ගත්ත ද, පත්වීම් දෙන අවස්ථාවේ අදාළ දිස්ත්‍රික්කයේ / පළාතේ පුරප්පාඩු නොමැති නම් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශික්ෂණලාභියා එකඟ වෙයි.</u>

මෙයට සාක්ෂි වශයෙන් මෙම දෙපක්ෂය විසින් මෙම ගිවිසුමට හා ඒ හා සමානභාවය හා දිනය දරන තවත් පිටපත් දෙකකට වර්ෂ දෙදහස් .............................. වූ ................................... මස .............................. දින වන මෙදින ......................................................... දී අත්සන් තබන ලදී.

..............................................

ශික්ෂණලාභියා

සාක්ෂ්‍යකරුවන් :

i. අත්සන : ..........................................

නම : .................................................................

තනතුර : ................................................................

ලිපිනය : .....................................................................................

ii. අත්සන : ..........................................

නම : .................................................................

තනතුර : ................................................................

ලිපිනය : .....................................................................................

..............................................

පීඨාධිපති

අධ්‍යාපන ලේකම් වෙනුවට

සාක්ෂ්‍යකරුවන් :

i. අත්සන : ..........................................

නම : .................................................................

තනතුර : ................................................................

ලිපිනය : .....................................................................................

ii. අත්සන : ..........................................

නම : .................................................................

තනතුර : ................................................................

ලිපිනය : .....................................................................................

(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සඳහා හා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්)

**පහත සඳහන් ඇපකරුවන්ගේ ප්‍රකාශ මේ සමඟ අමුණා ඇත.**

| අනු අංකය | ඇපකරුවන්ගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර | ඇපවන්නේ කා වෙනුවෙන් ද? |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

ඉදිරිපත් කරන ලද ඇපකරු ප්‍රකාශ සංඛ්‍යාව :

# ඇපකරුවන්ගේ ප්‍රකාශය

.............................. දින සිට ........................... ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඇතුළත් කිරීමට තෝරා

ගෙන ඇති ...........................................................................................................................

...................................................... ගේ බැඳුම්කරයට ඇපකරුවකු වන .......................................

................................................................................................................................ පදිංචි

.........................................................................................................................................

(සම්පූර්ණ නම)

වන මම,

පහත සඳහන් දේපළවල නිත්‍යානුකූල අයිතිකරු බවත්, ඒවායේ වටිනාකම, බැඳුම්කරයේ සඳහන් මුදල වූ රු. ................................................ ට වැඩි බවත් හෝ මාගේ රක්ෂාවෙන් හා පහත සඳහන් දේපළවලින් ලැබෙන ආදායම, ඇප බැඳුම්කරයේ සඳහන් මුදල වන රු. ........................................ ට වැඩි බවත් මෙයින් සහතික කරමි.

1. ඇපකරුගේ සම්පූර්ණ නම :- ..........................................................................................

   ..........................................................................................

2. සේවා ස්ථානය :- (ඒ) රජයේ ද

   (බී) වෙනත් ආයතනයක ද .................................................................

   .................................................................

3. දරන තනතුර :- ..............................................................................

4. ගුරුවරයකු / ගුරුවරියක නම්, ලියාපදිංචි කළ අංකය :- .........................................

5. දීමනා ඇතුළු වාර්ෂික වැටුප :- ..........................................................................

6. ඉඩමේ නම :- ..............................................................................................

7. පිහිටීම :-

   (ඒ) පළාත :- ....................................................................

   (බී) දිස්ත්‍රික්ක :- ....................................................................

   (සී) ගම :- ....................................................................

8. ප්‍රමාණය :- අක්කර - ........................ රූඩ් - .......................... පර්චස් - .........................

9. වටිනාකම :- රු. ....................................................................................

10. ඉඩම්වලින් ලැබෙන වාර්ෂික ආදායම :- ....................................................................

ඉහත සඳහන් කරන්නට යෙදුණු කරුණු, මා දන්නා පමණින් සත්‍ය හා නිවැරදි බව ද වැඩිදුරටත් සඳහන් කරමි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ගේ ලියවිල්ලකින් ලබන ලද අනුමැතිය නොමැතිව ඉහත කී දේපළ විකිණීම, උකස් තැබීම, අන් සතු කිරීම හෝ වෙනයම් අයුරකින් පරිහරණය කිරීම හෝ නො කරන හැටියටත් පොරොන්දු වෙමි.

.........................................

ඇපකරුගේ අත්සන

## ප්‍රධාන ණයකරුගේ (ශික්ෂණලාභියාගේ) ප්‍රකාශ පත්‍රය

.............................. දින සිට ........................... ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඇතුළත් කිරීමට තෝරා ගෙන ඇති පහත අත්සන් කරන ................................................................................................ .................................................................... වන මම, පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

1. සම්පූර්ණ නම :- ...............................................................................................
   ...............................................................................................
2. ස්ථිර ලිපිනය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
   ලිපිනය - ...............................................................................................
   ...............................................................................................
   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ...............................................................................
3. ස්ථිර දේපළ එනම් :-
   ඉඩමේ නම - .......................................................................................
4. පිහිටීම :-
   (ඒ) පළාත :- .......................................................................................
   (බී) දිස්ත්‍රික්ක:- .....................................................................................
   (සී) ගම :- .......................................................................................
5. ප්‍රමාණය :- අක්කර - ........................ රූඩ් - ........................ පර්චස් - ........................
6. වටිනාකම :- රු. .......................................................................................................

ඉහත සඳහන් කරන්නට යෙදුණු කරුණු, මා දන්නා පමණින් සත්‍ය හා නිවැරදි බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

දිනය :- ..............................

.................................................................

ප්‍රධාන ණයකරුගේ (ශික්ෂණලාභියාගේ) අත්සන